# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2005 අංක 21 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ **2005** අගෝස්තු මස **02** වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2005 අගෝස්තු මස 05 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල **:** රු. 4.25 යි.　　තැපැල් ගාස්තුව **:** රු. **5.00** යි.

# 2005 අංක 21 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2005 අගෝස්තු මස 02 වන දින]

එල්. ඩී.–ඕ. 45/2004.

**1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1**. මේ පනත 2005 අංක 21 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය.

**2**. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 14 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) එම වගන්තියේ (ඇ) ඡේදය ඉවත් කිරීමෙන් ; සහ

(ආ) එම වගන්තියේ (ඈ) ඡේදයේ "ඉහත කී දණ්ඩන නියමවලින් කවර හෝ දණ්ඩන නියම දෙකක් ඒකාබද්ධ කරන නීත්‍යානුකූල දණ්ඩන නියමයක්" යන වචන වෙනුවට "ඉහත කී දණ්ඩන නියමවලින් යම් දණ්ඩන නියමයක්" යන වචන ආදේශ කිරීමෙන්.

**3**. (අ) ප්‍රධාන ප්‍රඥප්තියේ 285 වන වගන්තියේ (2) වන උපවගන්තිය, 294, 295, 296, 297, සහ 298 වන වගන්ති මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 285 (2), 294, 295, 296, 297 සහ 298 යන වගන්ති ඉවත් කිරීම.

**4**. ප්‍රධාන ප්‍රඥප්තියේ 299 වන වගන්තියේ (3) වන උපවගන්තියේ "පැන ගිය, වරදකරු කරනු ලැබූ තැනැත්තකුට මරණීය දණ්ඩන නියමයක් හෝ දඩ ගැසීම හෝ බන්ධනාගාරගත කිරීම ද සහිතව හෝ රහිතව, කස පහර දීමේ හෝ දණ්ඩන නියමයන් කරනු ලැබූ විට, ඒ දණ්ඩන නියමය මරණීය දණ්ඩන නියමයක් හෝ දඩ ගැසීමේ හෝ කස පහර දීමේ හෝ දණ්ඩන නියමයක් නම්, මෙහි ඉහත සඳහන් විධිවිධානවලට යටත්ව, එය නොපමාව ක්‍රියාත්මක විය යුතු ය. ;" යන වචන වෙනුවට "පැනගිය, වරදකරු කරනු ලැබූ තැනැත්තකුට මරණීය දණ්ඩන නියමයක් හෝ දඩ ගැසීමේ හෝ බන්ධනාගාරගත කිරීම සහිතව හෝ රහිතව දණ්ඩන නියමයක් කරනු ලැබූ විට ඒ දණ්ඩන නියමය මරණීය දණ්ඩන නියමයක් හෝ දඩ ගැසීමේ දණ්ඩන නියමයක් නම් මෙහි ඉහත සඳහන් විධිවිධාන වලට යටත්ව එය නොපමාව ක්‍රියාත්මක විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 299 වන වගන්තිය සංශෝධනය කිරීම.

2-P L 000322 - 4,500 (2005/06)

ප්‍රධාන ප්‍රඥප්තියේ 317 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5**. ප්‍රධාන ප්‍රඥප්තියේ 317 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය ඉවත් කිරීමෙන් ; සහ

(2) එම වගන්තියේ (2) උපවගන්තියේ "(1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ දැක්වෙන අවස්ථාවෙහි හැර වෙනත් සියලු අවස්ථාවල දී" යන වචන වෙනුවට "ඒ හැර වෙනත් සියලු අවස්ථාවල දී" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**6**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.